Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ ක්‍රියාත්මක භාවය පිළිබඳ ඇගයුමක්ඃ කොළඹ මහ නගර සභාව ආශ්‍රිතව

*ඩබ්.ඩී.එම්. චතුරිකා, එස්.එම්.එස්. සඳරේණු ආර්.ඩබ්.බී.එම්. දිනේෂ් මධුසංක, ඩබ්.එම්.එල්.කේ. විජේනායක, ජී. ජී. ජයලනී පහලගේ* [1]
*එම්.කේ. නදීකා දමයන්ති* [2]

සංක්ෂේපය

බහුවාර්ගික රටක් වන ශ්‍රී ලංකාවේ ජනවාර්ගික කොටස් අතර ගැටුම් අවම කරමින් ඒකීය භාවය රැකගනිමින් සංවර්ධනය කරා යාමට ද්වි භාෂා ප්‍රතිපත්තිය ඉතා වැදගත් වේ. මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iv වන පරිච්ඡේදයෙන් සිංහල සහ දෙමළ භාෂා ජාතික භාෂා ලෙස පිළිගෙන ඇති අතර ඕනෑම පුරවැසියෙකුට තම මව් භාෂාවෙන් ශ්‍රී ලංකාව තුළ සපයන සේවා ලබාගැනීමටත්, කටයුතු කිරිමටත් අවස්ථාව හිමිවිය යුතුවේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ  රාජ්‍ය භාෂා ප්‍රත්පත්තිය සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවගේ අවබෝධය කෙසේද? සහ රාජ්‍ය අංශය තුළ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන්නේද? යන්න සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමයි. අධ්‍යයනය සඳහා කොළඹ මහනගර සභාව තෝරාගත් අතර සිංහල මෙන් ම දෙමළ භාෂාව කථා කරන ජනතාව ඒ තුළින් සේවය ලබා ගැනීම එම තෝරා ගැනීමට හේතුව විය. තොරතුරු ලබා ගැනීමේදී ප්‍රාථමික දත්ත රැස් කරනු ලැබුවේ ප්‍රශ්නාවලි භාවිත කරමිනි. අධ්‍යයනයේ නියැදිය ලෙස කොළඹ මහනගර සභාවේ සේවයේ නියුතු නිලධාරීන් 10ක් සහ එහි සේවය ලබා ගැනීම සඳහා පැමිණෙන සාමානය ජනතාවගෙන් 40 දෙනෙකු ද යොදා ගැණිනි. එයට අමතරව මෙම අධ්‍යයනය සඳහා ද්විතියික දත්ත සහ තොරතුරු භාවිතා කරන ලදී. අධ්‍යයනයෙන් ලබා ගත් ප්‍රමාණාත්මක දත්ත සහ තොරතුරු සරල සංඛ්‍යාන විධික්‍රම ඔස්සේ ද, ගුණාත්මක දත්ත සහ තොරතුරු විස්තරාත්මක ක්‍රමවේද ඔස්සේ ද විශ්ලේෂණය කරන ලදී. මහජනතාවගෙන් 45%ක් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබ නොදැනුවත් වූ අතර 30%ක් දැනුවත් භාවයකින් යුක්ත විය. එමෙන්ම නිලධාරීන්ගෙන් 50%ක් ඒ පිළිබඳ සම්පූර්ණයෙන් දැනුවත් බවත්, 40%ක් යම්තාක් දුරට දැනුවත් බවත් අනාවරණය විය. ඒ අනුව තහවුරු වන්නේ රාජ්‍ය සේවාව ක්‍රියාවට නංවන නිලධාරීන්ගෙන් පවා භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව නිසි පරිදි දැනුවත් වී නොමැති බවයි. නිලධාරීන්ගෙන් 40%ක් සේවා සැපයීමේ දී සිංහල පමණක් භාවිතා කරනු ලබයි. ජනතාවගෙන් 72%ක් අනාවරණය කළේ රාජ්‍ය අංශයේ සේවා සැපයීමේදී සිංහල භාෂාව පමණක් භාවිතා කරන බවයි. කොළඹ මහ නගර සභාවේ නිලධාරින් සහ සේවාලාභීන් අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ දී සේවාලාභීන්ගෙන් 20%ක් දුෂ්කරතාවලට මුහුණ දී ඇත. මේ අනුව තහවුරු වන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේදී ජනතාව මෙන්ම නිලධාරින් ද ඒ සම්බන්ධයෙන් නිසි ලෙස දැනුවත් වී නොමැති බවත් ක්‍රියාත්මක භාවයේ යම් යම් ගැටලු පවතින බවත්ය.

ප්‍රමුඛ පදඃ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය, රාජ්‍ය සේවය, සිංහල භාෂාව, දෙමළ භාෂාව,

*1. දේශපාලන විද්‍යාව, ආර්ථිකවිද්‍යාව, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*